

සිදුහත් කුමරු පියුම් සතක් මත වැඩම කිරීම

## ⁂ බුදු නැණ හා විදු නැණ දකින මරණයේ ස්වභාවය

– පිටිදූවේ සිරිධම්ම හිමි
– සාකච්ඡා කළේ බන්දුපාල ගුරුගේ

මරණයේ දී පුද්ගලයාට සිදුවන්නේ කුමක් ද යන ගැටලුවට විදු දැනුමෙන් සැපයුණු පිළිතුරු සහ බුදු දහම තුළින් ඒ පිළිබඳ ඉදිරිපත් වී ඇති කරුණු අතර තුලනාත්මක විමර්ශනයක් ලෙස – මේ ලිපිය හැඳින්විය හැකිය.

## ⁂ බුදු දහම හා සාමය

– බෝධි ශ්‍රී ශාස්ත්‍රී
මිනිස් සමාජයේ සාමය උදකිරීම සඳහා ඉවහල් වන බෞද්ධ ඉගැන්වීම් කිහිපයක් පිළිබඳ විමර්ශනයකි. සාමය සහ සමගිය සඳහා පුද්ගලයා තුළ සිදු විය යුතු චින්තන පරිවර්තනය කෙබඳු එකක් ද යන්න බෞද්ධ ඉගැන්වීම් අනුව විග්‍රහ කිරීම, ලේඛකයාගේ උත්සාහය වී ඇති බව පෙනේ.

## ⁂ බෞද්ධයා නම් කවරෙක්ද?

– මඩිහේ පඤ්ඤාසීහ මහ නාහිමි
පුද්ගලයකු – බෞද්ධයකු බවට පත් වූ බවට සැලකිය හැකි ධර්මානුකූල මිනුම් දඬු විග්‍රහ කිරීමට කරන උත්සාහයකි. තෙරුවන් සරණ යෑම බෞද්ධයකු බවට පත්වීමේ 'කඩ ඉම' වශයෙන් දැක්වෙන මෙම ලිපිය; (ශ්‍රී ලංකා බෞද්ධ සමාජයේ ඉහළ පිළිගැනීමක් ඇති විද්වත් හිමිනමක් විසින් සම්පාදනය කැරුණු ලිපියකි.)

## ⁂ බිබිලඹය පිළිමලෙන් රජමහ විහාරය

– කේ.ඒ. දුමින්ද කාරියවසම්
ශ්‍රී පාදස්ථානය වන්දනා කිරීමට යන කොළඹ – හැටන් මාර්ගයේ ගමන් කරන විට බිබිලඹය ප්‍රදේශයේදී හමු වන ඉපැරණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපියකි.

## ⁂ නවගමුවේ ඇසළ පූජෝත්සවය

–විහාරාධිපති හිමි
කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රදේශයට අයත් සුප්‍රකට නවගමුව රජමහ විහාරස්ථානය හා පත්තිනි දේවාලය මුල් කොටගෙන සිදු කැරෙන වාර්ෂික පෙරහර ඇතුළු ඇසළ පූජෝත්සවය පිළිබඳ වර්තමාන සහ ඓතිහාසික තොරතුරු ඇතුළත් ලිපියකි.

## ⁂ දෙව්නුවර ඇසළ උළෙල

මාතර දිස්ත්‍රික්කයේ සුප්‍රකට දෙවිනුවර රජමහ විහාරස්ථානය සහ විෂ්ණු දේවාලය මුල් කොටගෙන සිදු කැරෙන වාර්ෂික පෙරහර සහ ඇසළ පූජෝත්සවය පිළිබඳ වර්තමාන සහ ඓතිහාසික තොරතුරු ඇතුළත් ලිපියකි.

## ⁂ බුදුදහම විද්වත් ඇසින්

ලෝ පතළ විවිධ විද්වතුන් බුදු දහම පිළිබඳ පළ කළ අදහස්; ලෝකය පුරා විවිධ විෂය ක්ෂේත්‍ර තුළ ඉහළම පිළිගැනීමක් තිබූ පුද්ගලයන් – බුදුරදුන් සහ බුදු දහම තම නැණ පමණින් දුටු අයුරු.

## ⁂ බුදු සමයේ එන ජන සම්මත වාදය

– මහාචාර්ය කේ.එන්. ජයතිලක
බුදු දහමෙහි දැක්වෙන රාජ්‍ය පාලන උපදෙස් සහ සමාජ දර්ශනය පැහැදිලි කිරීමට දරණ උත්සාහයකි. සමාජයක ජීවත්වන සෑම පුද්ගලයකුගේම අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අදාළ වන බුදු දහමෙන් පෙන්වා දෙන ප්‍රායෝගික ජනසම්මතවාදී මූලධර්ම විග්‍රහ කිරීම මෙම ලිපියේ අරමුණ වී ඇති බව පෙනේ.

## ⁂ Uniqueness of Buddhism

*-by Ananda W. P. Guruge (UNESCO, Paris)*

## ඎ භික්ෂූන් වහන්සේගේ අයිතිය හඳුනා ගැනීම සමාජයේ වගකීමක්

– බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමි

භික්ෂූන් වහන්සේ සහ ගිහියා අතර ඇති විය යුතු සබඳතාව නිවැ–රැදි මඟට යොමු වී ශක්තිමත් වීම සඳහා ඒ දෙපාර්ශ්වය සතු විය යුතු ගුණ දහම් – ඉටු විය යුතු යුතුකම් හා වගකීම් ආදිය පිළිබඳ විමසන ලිපියකි. ශ්‍රී ලංකා බෞද්ධ සමාජයේ ඉහළ පිළිගැනීමක් ඇති ප්‍රකට විද්වත් හිමිනමක් විසින් සම්පාදනය කැරුණු ලිපියකි.

## ඎ වදාකඩ ගින්නේරිය පත්තිනි විහාරය

වයඹ පළාතේ වදකඩ ප්‍රදේශයේ පිහිටි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපියකි.

## ඎ බෞද්ධ පුනරුද ව්‍යාපාරයට ජීවය දුන් පාණදුරා වාදය

– පාණදුරාවාද අණුස්මරණ සභාව

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත් වූ යුගයේ විවිධ අන්‍යාගමික බලපෑම් නිසා – ශ්‍රී ලාංකීය සමාජය තුළ ඇතිවෙමින් තිබූ ශාසනික පරිහානිය අවම කරමින් – බුදු දහමේ විශිෂ්ටත්වය ජාත්‍යන්තර මට්ටමෙන් ප්‍රකට වීමට බල පෑ ඓතිහාසික ආගමික සංවාදයක් පිළිබඳ තොරතුරු හෙළිකරන ලිපියකි.

## ඎ තරහ නොගැනීම

– උඩුවේ ධම්මාලෝක හිමි
– සාකච්ඡා කළේ සීසර් සුදුසිංහ

“දියුණුවේ දෙරටු” විශේෂාංගය යටතේ මිනිසාගේ පෞද්ගලික හා සාමාජික අභිවෘද්ධියට බලපාන යහ පිළිවෙත් පිළිබඳ සාකච්ඡා කැරෙන ලිපි පෙළක දෙවැනි ලිපිය.